# කොවිඩ්-19 සති පාසල

# 10 ශ්‍රේණිය – ඉතිහාසය

## 4.2 ආර්ථිකය

- අතීතයේ මෙරට බොහෝ දෙනාගේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගය වූයේ ගොවිතැනයි. එය හේන් ගොවිතැන සහ වී ගොවිතැන ලෙස ප්‍රධාන අංශ දෙකකි.
- ගොඩ ගොවිතැන හෙවත් හේන් ගොවිතැන මෙරට පැරණිම ගොවිතැන් ක්‍රමය වන අතර විවිධ වර්ගයේ ධාන්‍ය වර්ග, එළවළු වර්ග, උක් කපු ආදී බෝග වර්ග රැසක් එහි වගා කර තිබේ. හේන් වලින් බදු අය කළ බවට ද සාධක ඇත.
- වී වගාව මෙරට පැවති ප්‍රධාන ගොවිතැන් ක්‍රමය වූ අතර යල සහ මහ යන ප්‍රධාන කන්න දෙකක් වගා කළ අතර වියළි කලාපයේ වැව් සහ වාරිමාර්ග මුල් කර ගනිමින් එය සිදු කළහ.
- ගොවිතැන් කටයුතුවලට අමතරව සත්ව පාලනය ද පැවති අතර ගව පාලනය ඉන් ප්‍රධාන විය. ඊට අමතරව කුකුළන් එළුවන් වැනි සතුන් ද ඇති කළහ.
- ඉතා පැරනි කාලයේ සිට මෙරට විවිධ කර්මාන්ත රැසක් පැවති අතර යකඩ,තඹ,මැණික්, ඇත්දත්,මැටි, සහ රෙදි විවීමේ කර්මාන්ත ඒ අතරින් වැදගත් විය.
- පැරණි ශ්‍රී ලංකාවේ වෙළෙඳාම ඉතා දියුණු මට්ටමක පැවති අතර අභ්‍යන්තර වෙළෙඳ කටයුතු වෙළෙඳ නගර හා වෙළෙඳ ගම් ආශ්‍රිතව සිදු කළ අතර දියුණු වෙළෙඳපොළවල් ද පැවතුණි.
- විදේශ වෙළෙඳ කටයුතු ද දියුණු මට්ටමක පැවති අතර විවිධ රටවල වෙළෙඳුන් සහ වෙළෙඳ කණ්ඩායම් විසින් මෙරට පිහිටි වරායන් රැසක් මුල් කොට ගෙන වෙළෙඳාමෙහි යෙදුනහ.

**<u>ක්‍රියාකාරකම්</u>**

1. පැරණි ශ්‍රී ලංකාවේ හේන් ගොවිතැන පිළිබඳව පහත අංශ යටතේ කෙටි විස්තර සපයන්න. (හේන් සකස් කිරීම, වගා කළ බෝග වර්ග, හේන් වලින් අය කළ බදු)
2. අතීතයේ මෙරට සිදු කළ වී වගාවේ ස්වරූපය පිළිබඳව කෙටි සටහනක් ලියන්න.
3. අතීතයේ දී මෙරට ගව පාලනය බහුලව සිදු කළ බවට ඇති සාධක මොනවාද ?
4. පැරණි ශ්‍රී ලංකාවේ පැවති කර්මාන්ත පිළිබඳව තොරතුරු ඇතුලත් කරමින් රුක් සටහනක් නිර්මාණය කරන්න.
5. අතීත ශ්‍රී ලංකාවේ දියුණු අභ්‍යන්තර වෙළෙඳාමක් පැවති බවට කරුණු පහත තුන ඇසුරින් උදාහරණ දෙමින් විස්තර කරන්න.
    - විවිධ වෙළෙඳුන් සහ වෙළෙඳ කණ්ඩායම් සිටි බව
    - දියුණු වෙළෙඳපොළවල් පැවති බව
    - වෙළෙඳ නීතිරීති පැවති බව
6. අතීත ශ්‍රී ලංකාවේ දියුණු විදේශ වෙළෙඳාමක් පැවත් බව කරුණු තුනක් ඇසුරින් පැහැදිළි කරන්න.
7. පහත සඳහන් සියලු ස්ථාන ලංකා සිතියමක ලකුණු කරන්න.
    - ජම්බුකෝලපට්ටන,සූකරතිත්ථ,මහාතිත්ථ,මගන,උරුවෙල,සල්වතොට,කාලතිත්ථ, හීමතිත්ථ,ගිම්හතිත්ථ,මහාවාලුකාගාම,නීලවලාතිත්ථ,දේවනගර,ගෝඨපබ්බත, තොටළුතොට,ගෝකණ්ණතිත්ථ,පල්ලවංක